වත්තල-මාබෝල නගර සභාව

ගම්පහ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 සැප්තැම්බර් 30 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව වත්තල-මාබෝල නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට වත්තල-මාබෝල නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය විසින් නගර සභාව වෙත සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබූ රු.1,379,000 ක් වටිනාකමැති ට්‍රැක්ටරය හා ටේලරය ද, 2009 වර්ෂයේ ලබාදී තිබූ රු.1,612,500 ක් වටිනාකමැති ට්‍රැක්ටරය හා ටේලර් දෙක ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ අතැති බඩු තොගයේ වටිනාකම රු.384,940 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු.3,108,240 ක් ලෙස පෙන්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු ඉන්ධන හා ස්නේහක තෙල් වියදම රු.598,683 ක් වුවත්, ණය හිමියෝ යටතේ රු.694,126 ලෙස දැක්වීම නිසා රු.95,443 කින් වියදම් හා ණයහිමියෝ වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඈ) ජර්නල් සටහන් අංක 17 මගින් $ගම නැගුම" රු.5,179,038 ක්ද, පළාත් සංවර්ධන ආධාර රු.1,985,380 ක වියදම ගිණුම් ගතකිරීමේදී පෙර ගෙවුම් ගිණුම බැර කරනු වෙනුවට ආදායම් වෙනුවෙන් තැන්පත් ගිණුමට බැරකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ණය හිමි ලෙස රු.25,770,000 ක් වෙන්කර ඇතත්, අදාල කර්මාන්ත සම්බන්ධ ඇස්තමේන්තු සකස් කිරීම, ගිවිසුම් අත්සන් කිරීම, මිළගණන් කැඳවීමක් හෝ ක්‍රියාත්මක කර නොතිබියදී, සාවද්‍ය ලෙස ණය හිමි ලෙස ගිණුම්වල පෙන්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම
---

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්
---

2013 මාර්තු 31 දින වන විට විගණන විමසුම් 12 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු. 28,925,713 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම
---

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.180,380,822 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්
---

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 08 කට අදාලව ශේෂයන්ගේ එකතුව රු.62,859,565 ක් වූ අතර, ඒවාට අදාළ උපයෝගී ලේඛණ හා වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු.102,421,672 ක් විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.12,908,037 ක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,914,820 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i.) | වරිපනම් හා බදු | 19,203 | 19,667 | 34,489 |
| (ii.) | බදු කුලී | 10,995 | 10,651 | 19,507 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 01 | 1,517 | 1,292 |
| (iv.) | වෙනත් ආදායම් | 151,561 | 29,793 | 14,626 |

2.2.2 හිඟ ආදායම් අය කිරීම

නගර සභා ආඥා පනතේ (255 අධිකාරය)170(i), 170(අ)(i) හා (2) වගන්ති ප්‍රකාරව අයවිය යුතු බදු, දඩමුදල් ආදිය අයකර නගර සභා අරමුදලට බැර කිරීම හා ඒ සඳහා පියවර ගැනීම ලේකම්වරයාගේ කාර්යය වුවද, රු.72,612,610 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සේවක ණය

වසර 12 ට වැඩි කාලයක් ඉක්මවා තිබූ සේවකයන් 105 දෙනෙකුගෙන් අයවිය යුතු රු.341,834 ක සේවක ණය අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) ජලබිල්පත් පියවීම

හැඳල හා මාබෝල වෙළඳ සංකීර්ණය බදුදී ඇතත්, එහි භාවිතා කරනු ලබන ජලය වෙනුවෙන් නගර සභාව විසින් ගෙවීම් කරනු ලබයි. 2009 වර්ෂයේ සිට 2011 ජනවාරි දක්වා ප්‍රමාද ගාස්තු ද සමඟ බාහිර පාර්ශවයක් භාවිතා කරන ජලය වෙනුවෙන් රු.521,073 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී සභාව ගෙවීම් කර තිබුණි. අදාල පාර්ශවයන්ගෙන් මෙම ජල බිල්පත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයුර්වේද බෙහෙත්ශාලා පුරප්පාඩු

නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව මගින් සමාලෝචිත වර්ෂයේදී රෝගීන් 4873 සඳහා රු.504,713 ක ඖෂධ ලබාදී ඇතත්, සුදුසුකම් ඇති ඖෂධ සංයෝජකවරයෙකු නොවන අයෙක විසින් බෙහෙත් ලබාදීම සිදු කර තිබුණී.

(ඈ) කම්කරු නාමලේඛන

නගර සභාවේ කර්මාන්ත අංශයේ සමහර සේවකයින් ඇතැම් දිනවල නාමලේඛන ලකුණු කිරීමක් හෝ අත්සන් කිරීමකින් තොරව කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

2008 ජූලි 30 වැනි දිනැති අංක 1560/6 දරන ගැසට් නිවේදනයේ iv (අ) වැනි කොටසෙහි නාගරික ඝන අපද්‍රව්‍ය කළමණාකරණ රීති මාලාව අනුව සභාව කටයුතු කර නොතිබුණි.

2.4 කාර්ය සාධනය

(අ) කාර්ය සාධන සැලැස්ම හා එහි ප්‍රගතිය

2012 වර්ෂය සඳහා වූ කාර්ය සාධන සැලැස්මට අනුව සැලසුම් කර තිබූ සංවර්ධන කටයුතුවල ප්‍රගතිය පිළිබඳ වාර්තා සකස්කර නොතිබූ අතර, සනාථ කර ගැනීමටද අවශ්‍ය තොරතුරු පවත්වා නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| | | අරමුණු ප්‍රමාණය | අරමුණු ඉටුකර ගැනීමේ ක්‍රියාකාරකම් ප්‍රමාණය | නිමකල ක්‍රියාකාරකම් ප්‍රමාණය | ඉලක්ක දිනට නිමකල බව සනාථ නොවූ ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| (i) | පොදු පරිපාලනය | 05 | 41 | 23 | 18 |
| (ii) | මූල්‍ය කළමණාකරණය | 09 | 24 | 19 | 05 |
| (iii) | මහජන සෞඛ්‍ය හා පරිසරය | 05 | 25 | 24 | 01 |
| (iv) | භෞතික සැලසුම් හා කර්මාන්ත | 08 | 32 | 16 | 16 |
| (v) | පුස්තකාල හා ප්‍රජා සංවර්ධනය | 02 | 10 | 09 | 01 |

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාර සැලැස්ම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

**(i)** ක්‍රියාකාර සැලැස්මේ ඉලක්කයන් සඳහා මූල්‍යමය වටිනාකම් දක්වා නොතිබුණි.

**(ii)** ක්‍රියාකාර සැලැස්මේ ඉලක්කයන් ඉටු කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් නොකරන ලදී.

**(iii)** සැලැසුමේ ඉලක්කයන් ළඟාකර ගැනීම මෙන්ම ප්‍රගතිය සැසඳීමට හැකිවන පරිදි ක්‍රමවේදයක් නොවුනි.

2.5 ඩෙංගු ව්‍යාපෘතිය

ඩෙංගු ව්‍යාපෘතිය අනුව දෛනිකව නිවාස 50 ක් පරීක්ෂා කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදි පරීක්ෂා කර තිබුනේ නිවාස 2600 ක ප්‍රමාණයකි.

මේ අනුව පරීක්ෂා කළයුතු නිවාස වලින් සියයට 75 ක ප්‍රමාණයක් පරීක්ෂා කර නොමැති බව නිරීක්ෂණය විය.

2.6 තොග පාලනය

පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) භාණ්ඩ මිළදී ගැනීම් සම්බන්ධයෙන් ගබඩා ණයහිමි ගිණුමක් පදනම් කරගෙන ගිණුම් තැබීමක් සිදුකර නොතිබුණි.

(ආ) ආරම්භක අතැති තොග ශේෂයන් සමාලෝචිත වර්ෂයේ වියදම්වලට ගැලපීම් කර නොතිබුණි.

(ඇ) අතැති තොග ගිණුම දිර්ඝ කාලයක සිට සෑම වර්ෂයකම අවසන් තොගය ගිණුම් ගතකිරීම පමණක් සිදුකර තිබීම මගින් දිගින් දිගටම අතැති තොගය ලෙස සාවද්‍ය විශාල වටිනාකමක් ගිණුම් වල පෙන්වා තිබුණි.

(ඈ) තොග පාලනය හා තොග ගිණුම් තැබීම සම්බන්ධයෙන් මනා අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.

2.7 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) මානව සම්පත් කළමනාකරණය